# ශ්‍රී ලාංකික සංක්‍රමණික අභියෝග 2

**විජේරත්න පතිරාජ**
කථිකාචාර්ය - කොළඹ විශ්ව විද්‍යාලය ශ්‍රීපාලි මණ්ඩපය



පසුගිය ලිපියෙන් අපගේ අවධානය යොමුවූයේ සංක්‍රමිකයන් හැටියට මෙරටට පැමිණ බොහෝ විට ස්ථිර පදිංචි තත්වයට පත්වීමටත්, ඉන් පසුව ශ්‍රී ලාංකිකයන්ට පොදුවේ මුහුණ පෑමට සිදුවන අභියෝග පිලිබඳවය. ඕස්ට්‍රේලියාවේ පදිංචිය ස්ථාවර කර ගැනීම සඳහා නීත්‍යානුකූලභාවය හා පැවැත්ම පවත්වාගෙන යාමේදී භෞතික හා සාමාජික වශයෙන් මුහුණපාන එම ගැටළු විවිධ දුෂ්කරතා මධ්‍යයේ හෝ විසඳා ගත හැකි වෙතත් ජාතියක් වශයෙන් ශ්‍රී ලාංකික ජන ගහන ව්‍යාප්තිය පිලිබඳ මතුවන ගැටළුව ජාතික අභියෝගයක් ලෙස දැන් අවධානයට ලක්වූවකි.

සිංහලයාගේ එකම ජන්ම භූමිය ලෙස සැලකෙන ශ්‍රී ලංකාව තුළ පවා වසරින් වසර අප මුහුණ දෙන ජාතික ගැටළුවක් නම් සංඛ්‍යාත්මකව සිංහලයාගේ වර්ධනය වේගය අඩුවෙමින් පැවතීමයි. අනුගමනය කෙරෙන උපත් පාලන ප්‍රතිපත්ති හමුවේ සැඟවුන නාය යමක් ලෙස එම ගැටළුවේ භයානකකම වැටහෙන්නේ අනෙකුත් සුළු ජාතීන්ගේ ජනගහන ව්‍යාප්තිය සමඟ සසදා බැලීමෙනි. එහි පවතින්නේ සිංහලයා ක්‍රමයෙන් ක්ෂය වී යන ප්‍රවනතාවකි. උත්පත්ති පාලන නීතිවලට නොදෙවෙනි ජනගහන පාලනයක් ඇතිකරන ප්‍රවනතාවක් ලෙස සංක්‍රමණික ගැටළුවද පැන නගී. එහිදී ඕස්ට්‍රේලියාවට අමතරව ඉතාලිය, සවුදිය, ජපානය, කොරියාව, ඉන්දියාව වැනි රටවල් රාශියකට, ශ්‍රී ලංකාව හැරදමා යන පිරිස වැඩි වන බව වාර්තාවේ.

මෙසේ ශ්‍රීල ලාංකිකයන් වෙනත් රටවලට සංක්‍රාමණය වීම මුලිකව වාණිජ පරමාර්ථ මුල් කරගන සිදුවන්නක් බව පිළිගත හැක. තම උපන් බිමෙන් නොලැබෙන භෞතික සම්පත් සොයා සුදුසුකම් ඇති අයවලුන් පියාඹා යාම වැළැක්විය හැක්කේ එම ප්‍රයශ්නය ජාතික ප්‍රශ්නයක් ලෙස සලකා විසඳුම් ඇති කිරීමෙනි. එවැනි පිළිගත් වැඩ පිළිවෙලක් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක නොවේ. එහෙත් සංක්‍රමිකයන් පිළිගෙන අවශ්‍ය පහසුකම් සළකා එම සම්පත තම රටේ සංවර්ධනයට යොදාගැනීමේ සැලසුම්ගත වැඩ පිළිවෙලක් ඕස්ට්‍රේලියාව වැනි බටහිර සංස්කෘතියන් තුළ පවතී. මෙසේ ශ්‍රී ලාංකික සංක්‍රමිකයන් ඒ ඒ රටවල නොනිල අයිතිකරුවන් බවට පත්වී යාමේදී මූලික වාණිජ අපේක්ෂාවන්ගෙන් ඔබ්බට, අනාගත දරු පරපුරක් බිහිවීම පාලනය කිරීමට සිදුවීමද නොවැලැක්විය හැක්කකි. අතිධාවනකාරී ජීවනරටාව තුළ දරු සුරතලයක් විඳ ගැනීමේ අභියෝගයට බොහෝ අය බිය වෙති. මන්ද එවන් පරිසරයක් තුළ දරුවන් හදාවඩා ගැනීම එතරම්ම ගැටළු රාශියක් ඇති කරවන්නක් හෙයිනි. අඹු සැමියන් දෙදෙනාම බොහෝ විට තම භෞතික අවශ්‍යතාවන් ඉටුකර ගැනීමේ රැකියා, තරගයේ නියුක්ත වන හෙයින් දරුවකු කුඩා අවධියේ සිට සුරැකුම් මධ්‍යස්ථානයකට භාරදී හදා වඩා දහසක් ගැටළු හමුවේ හෝ දරු උපතක් සිදුවුවහොත් ඔහු හෝ ඇය ශ්‍රීර ලාංකික අනන්‍යතාවට ඇති දැඩි කරගැනීම මුහුණ දිය යුතු ප්‍රබලම ගැටළුව වෙයි. මෙහි උපත ලබන සෑම සිංහල දරුවකුම නිත්‍යානුකූලව ඕස්ට්‍රේලියානු පුරවැසියකු බවට පත්වන බව අපි දනිමු. එහෙත් සෑම සිංහල මවක මෙන්ම පියකුද අපේක්ෂා කරන්නේ දරුවා අපේ කමට හදා වඩා ගැනීමයි. මෙම සානුකම්පික බේදවාචකයට බොහෝවිට පිළිසරණ වන්නේ අඹු සැමියන්ගේ දෙමව්පියන්ය. තම පෞද්ගලික ජීවිතයේ ශ්‍රී ලාංකික සියළු සුබ විහරණයන් කැපකොට විත් දරුවන්ගේ දරුවන් හැකිතාක් කල් රැකබලා ගැනීමට දෙපාර්ශවයේ මව්පියෝ හදපත්ලෙන් ඇප කැප වෙති. එකී ආච්චිලාගේ සහ සීයලාගේ සෙනෙහස පමණක් නොව නිවාස තුළ සිංහල බෞද්ධ සමාජ පරිසරයක් ඇතිවීමද දරුවන්ට ලැබිය හැකි මාහැඟි ආශිර්වාදයක් වන්නේය. එසේ දරුවන්ගේ ලෝකයද සිංහලකම මත ගොඩනංවා සෞභාග්‍යියට පත් පිරිස් දකින අපට ඔවුන් වික්ටෝරියානු සංස්කෘතිය ජයගත් වීරයන් ලෙස සලකා ආඩම්බරවිය හැකිය. වැඩිහිටියන්ගේ අවවාද අනුශාසනා සමඟ නැළවිලි ගී ගායනා තේරවිලි කතන්දර ආදියෙන් පෝෂණය ලබන සංක්‍රමණික පවුලක් යනු මෙරට ජීවත්වන ආශිර්වාද කැදැල්ලක් ලෙස හැඳින්විය හැකිය. එහෙත් ගැටළුව වන්නේ කී දෙනෙකුට කොපමණ කාලයක් මෙවැනි තත්වයක් පවත්වා ගත හැකිද? යන්නයි.

**මෙම සානුකම්පික බේදවාචකයට බොහෝවිට පිළිසරණ වන්නේ අඹු සැමියන්ගේ දෙමව්පියන්ය. තම පෞද්ගලික ජීවිතයේ ශ්‍රී ලාංකික සියළු සුබ විහරණයන් කැපකොට විත් දරුවන්ගේ දරුවන් හැකිතාක් කල් රැකබලා ගැනීමට දෙපාර්ශවයේ මව්පියෝ හදපත්ලෙන් ඇප කැප වෙති.**

ජීවන අපේක්ෂාවන් ලෙස රැකියාව නිවාස ප්‍රවාහන පහසුකම් ආදිය සාක්ෂාත් කර ගැනීම පමණක් තම ජීවිතය කරගත් සංක්‍රමික පිරිසක්ද නැත්තේ නොවේ. ඔවුන් මව්බිමෙන් ඈත් වූ සම්භාවනීය ඕස්ට්‍රේලියානු පුරවැසියන් ලෙස ගත කරනු ඇත. තවත් බේදවාචකයක් වන්නේ සියළු සම්පත් දිනාගත් ඇතැම් දෙමව්පියන්ගේ දරුවන්ගේ ගැටළුවලට විසඳුමක් නොමැතිවීමය. සිංහල සංස්කෘතියෙන් බැහැරව බටහිර සංස්කෘතියටම දරුවන් හැඩ ගැස්වීමේදී මේ පරිසරයේදී ඉතා වේගයෙන් මව්බිමෙන් මෙන්ම මව් සංස්කෘතියෙන්ද ඈත්වීම පුදුමයක් නොවේ. පළමුවෙන්ම දෙමව්පියන්ගෙන් හා මව්බසින් ඈත්වන ඔවුහු ක්‍රමයෙන් සිංහල සිතුම් පැතුම් ඇවතුම් පැවතුම් ආකල්ප වින්දන ආදියෙන්ද ඈත්වෙති. ඇවෑමෙන් ඔවුන් තම ඥාතිවරුන්ගෙන් පවා ඈත්වන්නේ සිංහලෙන් කතාකිරීමට නොහැකි නිසාය. සංස්කෘතික පරතරයන් නිසා මව්බිමට යාමට පවා මැලිවෙති. සිංහල සංස්කෘතියට අයත් එවැනි දරුවන්ට එවැනි තත්වයක් ඇතිකළේ මෙම ඕස්ට්‍රේලියානු රජය නොව අප අපම බව සිතා බැලිය යුත්තක් නොවන්නේද? ඔවුන්ගේ අනාගතය කුමන සීමාවකින් නතර වේදැයි අපට නිගමනය කළ හැකිද?

ජාතියක සංස්කෘතික ප්‍රබෝධය ජනිත කිරීම සඳහා තම ආගම හා කලාවද ගසට පොත්තක්, පොත්තට ගසක් මෙන් අපූර්වත්වයෙන් බද්ධවිය යුතු සාධක ලෙස මානව ඉතිහාසය පුරාම පිළිගෙන ඇත්තේ මෙවන් ගැටළුවලට පිළියම් සෙවීමේදීය. ඕස්ට්‍රේලියාවේ ගොඩනැගෙමින් පවතින ශ්‍රී ලාංකික සංස්කෘතිය තුළ විශේෂයෙන්ම වික්ටෝරියා ප්‍රාන්තයේ පන්සල් සේවන ආශිර්වාදයක් වන්නාසේම කලාව, සාහිත්‍ය පිලිබඳ ප්‍රවේශ රාශියක් සමාජ ගත වී තිබීමද අගැයුමට භාජනය විය යුතු අස්වැසිල්ලක් වන්නේය. සංක්‍රමණික සිංහල ජනතාව භාෂාවෙන් මෙන්ම රසිකත්වයෙන්ද පෝෂණය කළ හැකි නොමිලයේ බෙදා හැරෙන ප්‍රජා පුවත්පත් සේවාවක් පවත්වාගෙනයාම ඒ අතර කැපී පෙනේ. එවන් ප්‍රජා සත්කාරයක් ශ්‍රී ලංකාව තුළවත් දැකිය නොහැකිය. සන්නස, සිහනද, කැඩපත, පහන හා ලංකා ටමේස් ඉංග්‍රීසි ප්‍රකාශනයත් ඒ අතර ප්‍රමුඛ වේ. එමඟින් මෙරට පදිංචි වී සිටින බහුශ්‍රැත, වියත්, සිංහල ලේඛක * ලේඛිකාවන්, කලාකරුවන්ගේ විවිධ නිර්මාණ වලින් ලැබෙන සාහිත්‍යාලෝකය ආශිර්වාදයකි.

එම සංස්කාරක මණ්ඩල, කර්තෘවරුන් හා ලේඛකයන්ට සංක්‍රමණික ප්‍රණාමය හිමි විය යුතුය. මන්ද මෙවැනි යුරෝපීය සමාජයක අපේ සිංහල ප්‍රජාව පුළුල්ව අමතන වෙනත් මාධ්‍ය නොපවතින බැවිනි. අපගේ ජාතික අරමුණු ඉටු කර ගැනීමේ කිසියම් උත්තේජනයක් සම්පාදනය කර ගැනීමේ මඟක් ලෙස එම සම්පත යොදා ගත හැකිය. විශේෂයෙන්ම අපගේ සිංහල දරු පරපුර අතර භාෂා*සාහිත්‍ය නිර්මාණකරණය නංවාලීම සඳහා ළමා සංග්‍රහ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක වන්නේ නම් ඔවුන් තුළ සැඟවී ඇති නිසඟ කුසලතා මතුකර ගත හැකි වනු ඇත. ශ්‍රී ලාංකික දෛනික පුවත්පත් ළමා පරපුර ප්‍රමුඛ සිංහල ජනතාව අතර ව්‍යාප්ත කිරීමද වැදගත් මඟක් වනු ඇත.

මිට අමතරව අපගේ සිංහල සෞන්දර්ය කලාවන් මෙරට ජීවත් වන ශ්‍රීත ලාංකික පමණක් නොව, වෙනත් ජාතීන් අතරද ප්‍රවර්ධනය කිරීම සඳහා ඉමහත් සේවාවක් සපයන රංගන උදුම්බරා කලා කේන්ද්‍රයත්, අමා නර්තන ආයතනය, විශ්ව රංගායතනය, මෙන්ම 2014 සිට මෙරට ළමා රූපවාහිනී වැඩසටහනක් ලෙස සේවාවක් සපයන මෙල්බන් මුතුහර වැඩ සටහනත්, රූපවාහිනී හා ගුවන් විදුලි වැඩ සටහන්, මෙරට ජීවත් වන ප්‍රකට කලා ශිල්පීන්, රංගධරයන් හා නිර්මානකරුවන් සම්බන්ධ විවිධ ආයතන, ඕජ්ඣ පුරවැසි සංගම් ආදිය මඟින් පවත්වාගෙන යනු ලබන කලා කටයුතු මඟින්ද සිංහල සමාජ ප්‍රවර්ධනයට ලැබෙන මෙහෙවර ප්‍රශංසා කටයුතුය. මෙම ආයතනය මඟින් විශේෂයෙන්ම මෙරට උපදින මෙහි පුරවැසිකම් ලබන අනාගත ඕස්ට්‍රේලියානු සිංහල බාල පරපුර තුළ අපගේ භාෂා, සාහිත්‍යල, කලා අනන්‍ය තාවය තහවරු වෙන ලෙස දහම් පාසල් ව්‍යාළපෘතියට සමගාමී අනිවාර්ය පොදු වැඩ පිළිවෙලක් සකස් කරන්නේ නම් එය මෙරට සිංහල වැඩිහිටියන් විසින් තම අනාගත පරම්පරාවේ සුරක්ෂිත බව සුරැකීමට ගන්නා පුණ්‍යකර්මයක් වනු ඇත. මන්ද යත් ශ්‍රී ලංකාවේදී මෙන් මෙරට ඉංග්‍රීයසියෙන් අධ්‍යාපනය ලබන සිංහල විෂය මාලාව හරහා ස්වකීය භාෂා සාහිත්‍යය ඉගැනීමේ හෝ රස වින්දනය කිරීමේ භාග්‍යයක් නොලබන බැවිනි. ඕස්ට්‍රේලියානු රජය මඟින් සංක්‍රමිකයන්ගේ භාෂා සංවර්ධනය සඳහා මේ වන විට විවිධ භාෂා ඉගැන්වීමේ වැඩ පිළිවෙලක් සකස් කර ඇති බව පෙනී යාම සතුටට හේතුවකි. ශ්‍රී ලාංකික සංක්‍රමණික අභියෝග මෙම ලිපිය විවේචනයක් හෝ විචාරයක් නොව, මෙරට ජීවත්වන ශ්‍රී ලාංකික සහෘදයන් හා දූ දරුවන් පිළිබඳව මා තුල දැනුන සංවේදීතාව පෙළ ගැස්වීමක් බව ප්‍රකාශ කරනු කැමැත්තෙමි.



## කලාව හා මනුෂ්‍යත්වය

කලාව වූ කලී ඓතිහාසිකව මානවකයා තම දෛනික භෞතික අවශ්‍යවතාවයන්ගෙන් ඔබ්බට තමා අවට ලෝකය රමණීයත්වයෙන් දුටු අවස්ථාවේ සිට වර්තමානය දක්වාම නිර්මාණාත්මකව හැසිරීමට පිළිවන් පුළුල් ජීවන දැක්මකි. මානවයාගේ භාව විශෝධනය (හැඟීම් ප්‍රකාශණය) පදනම් කොටගෙන කලාව බිහිවූ බවට කල ග්‍රීක ඇරිස්ටෝටල් ගේ චින්තනයේ සිට කලාව යනු කුමක්දැයි ග්‍රන්ථාරූඪ කල ලියෝ ටෝල්ස්ටෝයි, මැක්ෂිම් ගෝර්කි වැනි ප්‍රකට නිර්මාණ කරුවන් දක්වා එය බහුවිධ දෘෂ්ටි කෝණයන් ඔස්සේ විග්‍රහයන්ට ලක් වී ඇත. මානවයා සහ මානව ස්වභාව ධර්මයේ අපූර්වත්වය අනුකරණාත්මකව

38 වන පිටට